# රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014(IV) අනුව සිංහල භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සඳහා I, II සහ III කාණ්ඩවල වයස අවුරුදු 50ට වැඩි නිලධාරින් විසින් සහභාගි විය යුතු පැය100 ක භාෂා පුහුණු පාඨමාලාව සඳහා වූ විෂය නිර්දේශය

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 මගින් දක්වා ඇති පරිදි සෑම රාජ්‍ය සේවකයෙකු ම තමන් රාජ්‍ය සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක ව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ලබා සිටිය යුතු ය. එසේ ම එම චක්‍රලේඛය සංශෝධනය කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හා එහි සංශෝධන අතර 2017.05.30 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014(IV) අනුව 2007.07.01දිනට පෙර රාජ්‍ය සේවයට ඇතුළත්ව සීමිත හෝ කුසලතා පදනම මත උසස්වීම් ලබා 2017.01.31 දිනට වයස අවුරුදු 50 සම්පූර්ණ කර ඇති හෝ 2007.07.01දිනට පෙර රාජ්‍ය සේවයට ඇතුළත්ව සීමිත හෝ කුසලතා පදනම මත උසස්වීම් ලබා ගන්නා අවස්ථාවේ දී වයස අවුරුදු 50 සම්පූර්ණ කර ඇති හෝ නිලධාරීන් සිංහල භාෂා ප්‍රවීණතාව ලබාගැනීමට සහභාගි විය යුතු පැය 100 ක භාෂා පුහුණු පාඨමාලාව සඳහා නිර්දේශිත විෂය නිර්දේශය මෙහි ඇතුළත් වේ.

දෙවන බසක් ලෙස සිංහල භාෂාව හැදෑරීමේ දී අනිවාර්යෙන් ම අත්පත් කර ගත යුතු දැනුම, කුසලතා හා ආකල්ප මෙම විෂය නිර්දේශයේ අන්තර්ගත වේ. දෙවන භාෂාව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද, පාඨමාලාව සංවිධානය හා එහි කාලය විෂය නිර්දේශයට ඇතුළත් කර ඇත. ඒ සඳහා දෙවන බස ඉගැන්වීම පිළිබඳ මනා පුහුණුවක් ලද උපදේශකවරයෙකුගේ සම්පත් දායකත්වය ආධුනිකයන් සඳහා අත්‍යවශ්‍ය වනු ඇත.

## අපේක්ෂිත අරමුණු

1. එදිනෙදා සරල සංවාදවල යෙදීම පිණිස ශ්‍රවණ හා කථන කුසලතා වර්ධනය කිරීම
2. ලිපි ලේඛන කියවීම පිණිස කියවීමේ කුසලතා වර්ධනය කිරීම
3. සරල ලිපි ලිවීමට හැකිවනු පිණිස ලිවීමේ කුසලතා වර්ධනය කිරීම්

## භාෂා පාඨමාලා උපදේශකවරුන් සඳහා ගෙවීම්

- පැය 100 පාඨමාලාව සඳහා 01 පැයකට අනුමත ගෙවීම රු. 500/=

| ඒකකය | අරමුණ | අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රමවේදය | කාලය පැය | කාලය බෙදන ආකාරය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | ශ්‍රවණය, කථනය හා කියවීම | ලිවීම |
| 01 | 1.1 භාෂාව ඉගෙනීම පහසු බව අවබෝධ කරමින් රුචිය ඇති කරයි.<br>1.2 තමා පිළිබඳ විස්තර කරයි.<br>1.3 වාචික ප්‍රකාශන උචිත පරිදි යොදා ගනිමින් කථනයේ යෙදෙයි. | • සිංහල දෙමළ සමරූපී වචන හඳුන්වා දීම<br>අම්මා අක්කා<br>ආච්චී මුදලාලි<br>• නම, ගම, වයස<br>• සුබ පැතීම්<br>• ස්තුති කිරීම, සමාව ඉල්ලීම, කණගාටුව ප්‍රකාශ කිරීම | • සිංහල වචන හඳුනා ගෙන කියයි.<br>• තමා පිළිබඳ විස්තර කියයි.<br>• සුබපැතුම් සඳහා භාවිත වන යෙදුම් කියයි.<br>• අවස්ථාවෝචිතව සුදුසු ප්‍රකාශන කරයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්විභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය | 02 | 02 | - |
| 02 | 2.1 නියමිත හැඩතල හඳුනාගනිමින් අකුරු ලිවීම.<br>2.2 පුද්ගල නාම හඳුනාගෙන කථනයේ යෙදෙයි. | • අකුරු ලිවීම.<br>සිංහල හෝඩියේ ස්වර අකුරු<br>• පවුලේ ඥාතීන් හඳුන්වන නම්<br>අම්මා තාත්තා<br>ආච්චී සීයා | • අකුරු නිවැරදි ව ලියයි.<br>• පුද්ගල නාම හඳුනාගෙන කියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්විභාෂා ක්‍රමය | 02 | 01 | 01 |
| 03 | 3.1 නියමිත හැඩතල හඳුනාගනිමින් අකුරු ලියයි. | • අකුරු ලිවීම.<br>සිංහල හෝඩියේ ව්‍යංජන අකුරු | • අකුරු නිවැරදි ව ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්විභාෂා ක්‍රමය | 02 | - | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 04 | 4.1 නියමිත හැඩතල හඳුනාගනිමින් අකුරු ලියයි. | • හෝඩියේ අකුරු යොදා ගනිමින් අර්ථවත් වචන ලිවීම<br>(පිල්ලම් රහිත වචන ) | • අකුරු නිවැරදි ව ලියයි.<br>• අලුත් වචන හඳුනා ගනියි. | ආදර්ශනය<br>අනුකරණය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්වීභාෂා ක්‍රමය | 02 | - | 02 |
| 05 | 5.1 පිල්ලම් භාවිතය පිළිබඳ දැනුම | • පිල්ලම් ලිවීම<br>• සම්පූර්ණ සිංහල හෝඩිය ලිවීම | • අකුරු නිවැරදි ව ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්වීභාෂා ක්‍රමය | 04 | - | 04 |
| 06 | 6.1 පුද්ගල හා ස්ථාන නාම හඳුනාගෙන කථනයේ යෙදෙයි.<br><br>6.2 සරල වචන පිල්ලම් සහිතව ලියයි. | • පවුලේ ඥාතීන් හඳුන්වන නම්<br>අම්මා තාත්තා<br>ආච්චි සීයා<br>• විවිධ ස්ථාන හඳුන්වන නම්<br>පාසල<br>කාර්යාලය<br>රෝහල<br>• පවුලේ ඥාතීන් හඳුන්වන නම් සහ විවිධ ස්ථාන හඳුන්වන නම් ලිවීම | • පුද්ගල හා ස්ථාන නාම හඳුනාගෙන කියයි.<br><br>• අකුරු නිවැරදි ව ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය | 03 | 01 | 02 |
| 07 | 7.1 නිවැරදි කථනය සඳහා සම්බන්ධාර්ථවාචී නාම වචන භාවිත කරයි.<br><br>7.2 සම්බන්ධාර්ථවාචී නාමවචන භාවිත කර තමා ගැන ලියයි. | • 'ගේ'ප්‍රත්‍යය භාවිත කරමින් පවුලේ අය ගැන හැඳින්වීම<br>මගේ අම්මාගේ නම<br>• පන්තියේ මිතුරා ගැන හැඳින්වීම<br>• තමා ගැන ලිවීම<br>නම, ගම, වයස | • "ගේ" ප්‍රත්‍ය සහිත නාම වචන යෙදුණු වාක්‍ය කියයි, ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 03 | 01 | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 08 | 8.1 ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද හඳුනා ගැනීම. | • එළවළු, පලතුරුවල නම් කියවීම හා ලිවීම<br>• සතුන්ගේ , කුරුල්ලන්ගෙ නම් කියවීම හා ලිවීම<br>• භාණ්ඩවල නම් හා ලිවීම | • ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද හඳුනාගෙන කියයි, ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>ද්වීභාෂා ක්‍රමය<br>සමරූපී අක්ෂර ක්‍රමය<br>කණ්ඩායම් ක්‍රියාකාරකම් | 02 | 01 | 01 |
| 09 | 9.1 විවිධ ඉල්ලීම් හා උපදෙස්වලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | • ඉල්ලීම්<br>• විධාන ක්‍රියා, | • විධාන ක්‍රියා සහිත කෙටි වාක්‍ය කියයි.<br>• විධාන ක්‍රියා සහිත කෙටි වාක්‍ය ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 02 | 01 | 01 |
| 10 | 10.1 නාමපදයක ප්‍රාණවාචී සහ අප්‍රාණවාචී භේදය හඳුනාගෙන ක්‍රියා පද නිවැරදිව භාවිත කරයි. | • ඉන්නවා, තියෙනවා<br>බල්ලා ඉන්නවා<br>කැරට් තියෙනවා | • ඉන්නවා, තියෙනවා යන පද නිවැරදි ව යොදා වාක්‍ය කියයි, ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස | 02 | 01 | 01 |
| 11 | 11.1 ක්‍රියා පද හඳුනා ගනියි. | • සරල ක්‍රියාපද කියවීම<br>කනවා<br>යනවා<br>• එම ක්‍රියාපද ලිවීම | • ක්‍රියා පද නිවැරදි ව යොදා වාක්‍ය කියයි. ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 02 | 01 | 01 |
| 12 | 12.1 ක්‍රියා පදවලින් සකස් කර ගන්නා පද රටා හඳුනා ගනියි.<br><br>12.2 කාලභේදය අනුව ක්‍රියාපද උචිත පරිදි භාවිත කරයි. | • පදරටා<br>යනවා-යන්නෙ<br><br>• ක්‍රියා පද<br>අනතීත<br>අතීත | • පද රටා අනුව කුඩා වාක්‍ය කියයි,<br>• කාලභේදය අනුව ක්‍රියාපද කියයි .<br>• පද රටා අනුව හා කාල බේදය අනුව ක්‍රියාපද ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස | 04 | 02 | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 13 | 13.1 සංඛ්‍යා නාම උචිත පරිදි භාවිත කරයි. | • සංඛ්‍යා 1සිට 10,000 දක්වා<br>• වෙලාව කීම | • 1 සිට 10,000 දක්වා<br>• නිවැරදි ව ගණන් කරයි.<br>• ලිවීමට පුහුණු වෙයි.<br>• වෙලාව නිවැරදි ව කියයි.ලියයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 06 | 03 | 03 |
| 14 | 14.1 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් ද්‍රව්‍ය හා පුද්ගලයින් කාලය පිළිබඳ විමසයි. | • ප්‍රශ්නඇසීම<br>කවුද ?<br>මොකක් ද ?<br>මොනවා ද?<br>කොහේ ද?<br>කොහොම ද?<br>ද?<br>කීයට ද?<br>කීයද? | • ප්‍රශ්නවාචී පදය භාවිත කරමින් ප්‍රශ්න අසයි.<br>• ප්‍රශ්න සඳහා පිළිතුරු දෙයි.<br>• කුඩා ප්‍රශ්න හා පිළිතුරු ලියයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 06 | 04 | 02 |
| 15 | 15.1 අර්ධ ක්‍රියා පද කතාබහේ දී නිවැරදි ව යොදා ගනියි. | • අර්ධ ක්‍රියා<br>ඕන, එපා, බෑ, පුළුවන් | • අදහස් ප්‍රකාශනයේ දී ඕන, එපා, බෑ, පුළුවන් යන පද අවස්ථාවෝචිත ව භාවිත කර කියයි, ලියයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 04 | 02 | 02 |
| 16 | 16.1 ඒක වචන ,බහු වචන පිළිබඳ අවබෝධය ලබා ගනියි.<br>16.2 සිංහල භාෂාවේ ලිංග භේදය පිළිබඳ අවබෝධය ලබා ගනියි. | • ඒක වචන බහු වචන<br>• ස්ත්‍රී ලිංග, පුරුෂ ලිංග, නපුංසක ලිංග පද | • ඒක වචන, බහු වචන සකස්වන ආකාරය ලියයි.<br>• ස්ත්‍රී ලිංග, පුරුෂ ලිංග, නපුංසක ලිංග පද ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම්<br>ද්වීභාෂා ක්‍රමය | 06 | 02 | 04 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 17 | 17.1 විශේෂණ පද භාවිත කිරීම පිළිබඳ අවබෝධය ලබා ගනියි. | • නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද | • විශේෂණ පද යොදා වාක්‍ය කියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 04 | 03 | 01 |
| 18 | 18.1 එදිනෙදා කටයුතු හා බැඳුණු කරුණු පිළිබඳ දැනුම ලබා ගනියි. | .<br>• සතියේ දිනවල නම්<br>• මාසවල නම්<br>• අද,හෙට,අනිද්දා | • සතියේ දිනවල හා මාසවල නම් කියයි .<br>• සතියේ දිනවල හා මාසවල නම් ලියයි.<br>• කාලවාචී නිපාත පද සහිත වාක්‍ය කියයි.<br>• කාලවාචී නිපාත පද සහිත වාක්‍ය ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>භූමිකා රංගනය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 04 | 02 | 02 |
| 19 | 19.1 සිංහල භාෂාවේ නිපාත පිළිබඳ දැනුම ලබා ගනියි. | • නිපාත පද<br>ද , ත්, සහ, සමඟ, සිට දක්වා , වැනි | • සුදුසු පරිදි නිපාත යොදන ආකාරය හඳුනාගෙන වාක්‍ය කියයි.<br>• එවැනි වාක්‍ය ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 04 | 03 | 01 |
| 20 | 20.1 කතාබහේ දී සර්ව නාම පද උචිත පරිදි භාවිත කරයි. | • සර්ව නාම<br>එතන, මෙතන, අතන,<br>ඔතන<br>ඒක, මේක ,අරක | • සර්ව නාම යෙදුණු වාක්‍ය කියයි. ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 04 | 02 | 02 |
| 21 | 21.1 ක්‍රියාපද විභක්ති අනුව වර නැඟීමට ඉගෙන ගනියි. | • සරලව විභක්ති 09හි ප්‍රත්‍ය<br>යොදා වචන ,වාක්‍ය කියවීම, ලිවීම | • සරල වාක්‍ය අවබෝධ කර ගනියි, ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ව්‍යාකරණ පරිවර්තන ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 10 | 04 | 06 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 22 | 22.1 උචිත පද භාවිත කරමින් මගසලකුණු කියයි. | • පාරකීම, දකුණට, වමට, ඉස්සරහට, පස්සට | • නිවැරදි ව මග සලකුණු කියයි.<br>• ඊට අදාළ වචන ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 02 | 02 | - |
| 23 | 23.1 එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කෙටි ලිඛිත ප්‍රකාශන සවන් දී අවබෝධ කර ගනියි. කියවයි. ලියයි. පරිවර්තනය කර ලියයි. | • දැන්වීම්,<br>• උපදෙස්<br>• පුවත්පත් නාම<br>• තනතුරු නාම<br>• කාර්යාලවල නම් | • දැන්වීම්, උපදෙස් පුවත්පත්වල නම්, තනතුරු නාම, කාර්යාලවල නම් කියවයි.<br>• ලියයි.<br>• පරිවර්තනය කරයි. | ප්‍රශ්නකරණය<br>ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 12 | 08 | 04 |
| 24 | 24.1 එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කෙටි ලිපි ලිවීමට පුහුණු වෙයි. | • රාජකාරි ලිපි ආකෘති | • සරල රාජකාරි ලිපි ලියයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ද්වීභාෂා ක්‍රමය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 04 | - | 04 |
| 25 | 25.1 එදිනෙදා කටයුතු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කෙටි සංවාද, කෙටි කථා පුහුණු වෙයි. | • වෙළඳ පොළේ දී<br>• තැපැල් කාර්යාලයේ දී<br>• ආපනශාලාවේ දී<br>• පිළිගැනීමේ කථා<br>• ස්තුති කථා | • සරල සංවාද කරයි.<br>• කථාවක් පවත්වයි. | ආදර්ශනය<br>අනුකරණය<br>ප්‍රායෝගික අභ්‍යාස<br>කණ්ඩායම් ක්‍රියාකාරම් | 04 | 04 | - |